**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය - 2013**

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 14(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම්වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළ දී රු.28,280,000ක් වටිනා මෝටර් රථ මිලදී ගැනීමට අපේක්ෂා කර තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු බැඳීමක් ඇතිවන පරිදි ගනුදෙනුවක් සිදු වී නොතිබියදීත් එකී මෝටර් රථ වටිනාකම වාහන මාර්ගස්ථ තොග ලෙස හා වගකීම ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් විගණනයේ දී පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | වාහන අළුත් වැඩියාව | 1,042,108 | බිල්පත්වල මුල් පිටපත්, මෝටර් කාර්මික නිලධාරින්ගේ තහවුරු වාර්තා හා මුදල් ගෙවීම් සනාථ කෙරෙන ලදුපත්වල මුල් පිටපත් |
| (ආ) | මත්තලට යාම සඳහා පාසල් ළමුන් ප්‍රවාහනය කිරිමේ වියදම | 360,000 | චාරිකාව සඳහා සහභාගි වූ පාසැල් වල විස්තර, අදාල විදුහල්වල විදුහල්පතිවරුන්ගේ සනාථ ලිපි, ළමුන් ගණන, ප්‍රවාහනය කළ බස් රථවල අංක |
| (ඇ) | පුත්තලම හා හලාවත ප්‍රදේශයේ මහජනතාව රැස්වීමක් සඳහා ප්‍රවාහනය කිරිම සහ ඔවුන්ගේ ආහාර වියදම් | 494,000 | මහජනතාව නොමිලේ ප්‍රවාහනය කිරීමට සිදුවූ හේතු , මෙම වියදම ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් දැරිමට ඇති අවශ්‍යතාව, ආහාර නොමිලේ ලබා දීමට සිදුවූ හේතු, ප්‍රවාහනය කළ බස් රථ වල අංක හා ප්‍රවාහනය කල පුද්ගලයින් ගණන |
| (ඈ) | ගුවන් කේන්ද්‍ර සංකල්ප පිළිබඳ උපාධිධාරින් දැනුවත් කිරිමේ දේශන | 337,500 | සහභාගි වූ උපාධිධාරින්ගේ නාම ලේඛනය ඔවුන් කවර උපාධියක් ලබාගෙන තිබේ ද, ඔවුන්ගේ විශ්ව විද්‍යාලය, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංක, පෞද්ගලික ලිපිනය ආදී විස්තර . |

## 2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත | |
| (i) 10 (5) වගන්තිය. | විසර්ජනයෙන් පසුව ඉතිරිවන ආදායම් අතිරික්තය ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු වුවත් 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සමුච්චිත ලාභය නිසි පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ විසර්ජනයෙන් පසු රු.585,512,555ක ලාභය ඒකාබද්ධ අරමුදලට බැර කිරිමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 11 වගන්තිය | භාණ්ඩාගාර පූර්ව අනුමැතියක් හෝ ආවරණ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ දී අවස්ථා 19ක දී රු.801,046,519 ක මුදලක් ආයෝජනය කර තිබුණි. |
| (ආ) 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | නිල වාහන හැර අනෙකුත් සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ එම ආයතනයේ නම සඳහන් කළ යුතු වුවත් වාහන 04ක එසේ කර නොතිබුණි. |
| (ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14. 1 වගන්තිය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව රු.මිලියන 50 ක් ඉක්මවන ගනුදෙනු සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගතයුතු වුවත් අධිකාරිය සඳහා රු.106,021,080 ක ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) <u>රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ</u> | |
| (i) 2006 ඔක්තෝබර් 9 දිනැති අංක පීඊඩී 39 දරන චක්‍රලේඛය | (i) අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හතර දෙනෙකුට චක්‍රලේඛයේ සීමාව ඉක්මවා රු.1,681,798 ක වැඩිපුර ඉන්ධන ලබා දී තිබුණි.<br>(ii) චක්‍රලේඛයට පටහැනිව අනුයුක්ත කළ නිල වාහනයට අමතරව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පෞද්ගලික කටයුතු සඳහා වෙනත් වාහනයක් සඳහා සමාලෝචිත වර්ෂය තුල ඉන්ධන වෙනුවෙන් රු.685,315ක් වැයකර තිබුණි. |
| (ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍රලේඛයේ 9.12 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව අධිකාරියේ සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සියළුම සාමාජිකයන් සඳහා රෝහල් හා ශල්‍යකර්මයන් වෙනුවෙන් පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගැනිමට සමාලෝචිත වර්ෂයේදී රු.7,538,843 ක දායක මුදලක් වැය කර තිබුණි. මෙම රක්ෂණ ආවරණය සඳහා එක් සේවකයෙකු වෙනුවෙන් වාර්ෂික රක්ෂණ වාරිකය රු.38,400 සිට රු.60,600 දක්වා වූ ප්‍රමාණයක් විය. |

| | |
|---|---|
| (ඉ) 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 111 (අ) වගන්තිය සහ 2011 අයවැය ප්‍රකාශය | සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුප් සහ අනිකුත් ඉපයීම් වෙනුවෙන්, උපයන විට ගෙවීම් බදු මුදල් පුද්ගලික වැටුපෙන් ගෙවිය යුතු වුවද 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වසර 06ක් සඳහා එකතුව රු.16,995,279ක් වූ උපයන විට ගෙවීම් බදු මුදල් අධිකාරියේ අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඊ) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i) චක්‍රලේඛයට පටහැනිව නිල වාහන සඳහා හිමිකම් නොමැති ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් 11 දෙනෙකුට මාසයකට රු.30,000 බැගින් ද විධායක නිලධාරීන් 41 දෙනෙකුට මාසයකට රු.20,000 බැගින් ද කාර්යාල සහායකයින් ඇතුලු අනෙකුත් නිලධාරීන්ට 85 දෙනෙකුට මාසයකට රු.13,250 බැගින් ද ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී චක්‍රලේඛයට පටහැනිව ගෙවන ලද මුළු ප්‍රවාහන දීමනාව පිළිවෙලින් රු.28,348,259 ක් සහ රු.27,794,875ක් විය.<br><br>(ii) චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව නිල වාහන ලබාගැනීමට හිමිකම් නොමැති නිලධාරීන් දෙදෙනෙකුට මසකට රු.22,680 බැගින් රු.543,994 ක් ද තවත් නිලධාරීන් 8 දෙනෙකුට මසකට රු.19,440 බැගින් රු.1,787,500ක් ද තවත් නිලධාරියෙකුට රු.14,440 බැගින් රු.138,700 වශයෙන් එකතුව රු.2,470,194 ක් වූ මුදලක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (උ) 2012 දෙසැම්බර් 24 දිනැති අංක 49 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාර ව්‍යවස්ථාපිත මණ්ඩලවල උපරිමය රු.10,000 කට සමාන ප්‍රසාද දීමනාවක් ගෙවිය හැකි වුවත් එය නොසලකා එක් එක් නිලධාරියාගේ මාසික මූලික වැටුපට සමාන මුදලක් ප්‍රසාද දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි. එසේ ගෙවා තිබූ මුළු ප්‍රසාද දීමනා මුදල රු.3,405,591 ක් විය. |
| (ඌ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) චක්‍රලේඛයට පටහැනිව විධිමත් වූ අනුමැතියකින් තොරව නිලධාරීන් 06 දෙනෙකුට වෘත්තිය දීමනා ලෙස රු.25,000 බැගින් ද එක් නිලධාරියෙකුට 10,000 බැගින් ද විශේෂ දීමනාවක් මාසිකව ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එසේ ගෙවන ලද මුළු දීමනා එකතුව රු.1,895,000 ක් විය.<br><br>(ii) අධ්‍යක්ෂ ජනරාල් ධුරයේ වැඩ බැලීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාට මාසයකට රු.17,625 ක් බැගින් වැඩ බැලීම් දීමනාවක් ගෙවන ලද අතර 2010 මැයි මාසයේ සිට ඔහු තනතුරේ වැඩ බැලීමෙන් ඉවත් කිරීමෙන් පසුව ද විශේෂ දීමනාවක් ලෙස වැටුපට එකතුකර ගෙවා තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනතෙක් විධිමත් භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව ගෙවීම් කර තිබුණු මුළු වැඩ බැලීමේ දීමනාව රු.742,250 ක් විය. |

| | |
|---|---|
| (ඵ) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන මුදල් චක්‍රලේඛය | (i) 2010 සහ 2011 වර්ෂ වලදී නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් රු.14,000 සිට රු.60,000 දක්වා වූ මාසික ජංගම දුරකථන බිල්පත් අධිකාරිය මඟින් ගෙවා තිබුණි. මෙසේ සීමාව ඉක්මවා ගෙවීම් කර තිබූ පිළිවෙලින් රු.150,149 ක් සහ රු.6,846ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වනතෙක්ම එකී නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. |
| (ඒ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා උපාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යා යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඔ) 2007 පෙබරවාරි 28 දිනැති අංක සී.එස්.ඒ/පී .1/40 දරන ජනාධිපති චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව පහත සඳහන් වියදම් අධිකාරියේ අරමුදලින් දරා තිබුණි.<br>(i) සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිලධාරීන් මත්තල ගුවන් තොටුපල විවෘත කිරීමේ උත්සවය සඳහා සහභාගී වීමට සුඛෝපභෝගී හෝටල් වල නවාතැන් ගැනීම සහ ආහාර පාන සඳහා රු.768,273 ක් වියදමක් දරා තිබීම.<br>(ii) අධිකාරියේ නිලධාරීන් රාජකාරි කටයුතු සහ විවිධ සම්මන්ත්‍රණ හා වැඩමුළු සුඛෝපභෝගී හෝටල් වල නවාතැන් ගැනීම වෙනුවෙන් හා ආහාර පාන සඳහා එකතුව රු.2,747,241 ක් වැයකර තිබුණි. |

**2.4 ප්‍රමාණාත්මක අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධිකාරියේ රියදුරු සහ කාර්යාල කාර්ය සහායක නිලධාරීන්ගේ වැටුප සියයට 5 කට ආසන්න ප්‍රමාණයකින් වැඩිවන පරිදි එක්වර වැටුප් වර්ධක කිහිපයක් ප්‍රදානය කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.813,671,859 අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.618,187,444 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.195,484,415 ක වාසිදායක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙහෙයුම් ආදායම සහ සේවා සැපයීමෙන් ලැබූ ආදායම වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3. 2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ගුවන් මඟී සංචලන වැඩිවීම් මත විදේශ විකුණුම් අධිභාර ආදායම වැඩිවීම 19.18 ක වැඩිවීමක් ද කාර්ය මණ්ඩල වියදම්, විදේශ සම්මන්ත්‍රණ පුහුණු හා වැඩමුළු සඳහා වියදම වැඩිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදමේ වැඩිවීම සියයට 1.55 ක් ද විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඉකුත් වර්ෂ දෙක හා සසඳා සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කාර්යයන්ගේ ප්‍රගතිය පිළිබඳ විග්‍රහයක් පහත දැක්වේ.

| | විෂයය | විස්තරය | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| (i) | ගුවන් යානා චලන | * කුලී පියසර | 2,556 | 2,118 | 1,782 |
| | | * නිත්‍ය පියසර | 48,413 | 46,616 | 41,891 |
| (ii) | සම්පූර්ණ කරන ලද පරීක්ෂණ (සංඛ්‍යාව) | * ගුවන් සංතරණ සේවා | 01 | 01 | 01 |
| (iii) | ඉටුකරන ලද නිරුපද්‍රිත/ සුරක්ෂිත හා අධීක්ෂණ කාර්යයන් (සංඛ්‍යාව) | * රුම්ප් පරීක්ෂණ ගණන (ගුවන් යෝග්‍යතාවය) | -- | -- | 65 |
| | | * ගගන යාත්‍රාංගනය | 39 | 19 | 20 |
| | | * අන්තරාකාරි භාණ්ඩ | 09 | 18 | 35 |
| | | * පියසර පාසැල් පරීක්ෂණ (පුද්ගල බලපත්‍ර) | 08 | 14 | 13 |
| | | * ස්ථාන පහසුකම් මෙහෙයුම් | 00 | 02 | 04 |

- වසරින් වසර ක්‍රමිකව ශ්‍රී ලංකාවට පැමිණෙන ගුවන් යානා සහ ගුවන් මෙහෙයුම් වැඩි වී ඇති නමුත් සිවිල් ගුවන් සේවා නියාමනයට අදාළ පරීක්ෂණ ප්‍රමාණවත් පරිදි වැඩිකර නොමැති බව නිරීක්ෂණය විය.

- ගුවන් මෙහෙයුම් කටයුතු වල දී සිදුවන ගුවන් අනතුරු සිද්ධීන් වාර්තා කිරීම්, පරීක්ෂණ පැවැත්වීම් හා එම සිද්ධීන් අවම කිරීම් සඳහා අධිකාරිය ගෙන තිබෙන ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර විගණනයෙන් ඉල්ලා තිබූ නමුදු ඒ සම්බන්ධ කිසිඳු විස්තරයක් විගණනයට ලබා දී නොතිබුණෙන් අධිකාරියේ මෙහෙයුම් කාර්ය සාධනය සම්බන්ධව පුළුල් විග්‍රහයක් කල නොහැකි විය.

**(ආ) සිවිල් ගුවන් සේවා අධිකාරිය ඉටුකරන සේවා සඳහා ගාස්තු සංශෝධනය නොකිරීම**

අධිකාරිය විසින් ගුවන් නියමු බලපත්‍ර ලබාදීම, විදුලි සංදේශ සංඥා කුළුණු සඳහා අනුමැතිය ලබදීම, උස් ගොඩනැගිලි සඳහා අනුමැතිය ලබාදීම ආදී වූ විවිධ සේවාවන් සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු 2006 වර්ෂයේ දී අවසන් වරට සංශෝධනය කර තිබූ බැවින් පසුගිය වසර 07 ක කාලය තුල කිසිඳු ගාස්තු සංශෝධනයක් සිදුකර නොතිබුණි.

ගාස්තු හා බලපත්‍ර නිකුත් කිරීම් හා අළුත් කිරීම් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

**(i) ගාස්තු අයකිරීම්**

| බලපත්‍ර වර්ගය | මූලික බලපත්‍ර ගාස්තුව | ඇගයීම් ගාස්තු | අළුත් කිරීම | අළුත් කිරීම ඇගැයීම් |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| නියමු - ශිෂ්‍ය | 690 | 500 | 345 | 250 |
| නියමු- පෞද්ගලික | 1,380 | 500 | 690 | 250 |
| නියමු - වාණිජ | 4,140 | 1,500 | 1,035 | 750 |
| නියමු-ගුවන් ප්‍රවාහන | 6,900 | 2,000 | 1,725 | 1,000 |
| ගුවන් සංඥා පාලන | 1,380 | 500 | 345 | 750 |
| ගුවන්යනා මෙහෙයුම් ඉංජිනේරු | 2,070 | 1,500 | -- | -- |

ඉහත සේවා සඳහා අය කරන ගාස්තුව, අධිකාරිය විසින් දරනු ලබන පිරිවැය ආවරණය කිරීමටද ප්‍රමාණවත් නොවන මුදලක් බව නිරීක්ෂණය විය.

**(ii) බලපත්‍ර නිකුත් කිරීම් හා අළුත් කිරීම්**

| බලපත්‍ර වර්ගය | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| නියමු - ශිෂ්‍ය | 231 | 155 | 115 | 142 |
| නියමු- පෞද්ගලික | 110 | 94 | 98 | 76 |
| නියමු - වාණිජ | 339 | 264 | 317 | 300 |
| නියමු-ගුවන් ප්‍රවාහන | 498 | 414 | 382 | 359 |
| ගුවන් සංඥා පාලන | 26 | 44 | 81 | 91 |
| ගුවන්යානා මෙහෙයුම් ඉංජිනේරු | 05 | 113 | 173 | 283 |

**(ඇ) ගුවන් යානා සිද්ධීන්**

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවාවේ නියාමනය සඳහා පිහිටුවා ඇති සිවිල් ගුවන් සේවා අධිකාරිය තම නියාමන කටයුතු කාර්යක්ෂමව හා ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව සිදුකරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා අධිකාරියට වාර්තා වූ ගුවන් යානා සිද්ධීන් සහ එම සිද්ධීන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම්, අධිකාරිය පවත්වාගෙන යනු ලැබූ ලිපිගොනු සහ අධිකාරිය කලින් කලට දන්වන ලද මග පෙන්වීම් හා නියෝගයන් පිළිබඳව තොරතුරු විගණනයට ලබාදෙන ලෙස ඉල්ලා සිටියදීත් ඒ සම්බන්ධ කිසිදු තොරතුරක් ඉදිරිපත් නොකිරීමෙන් අධිකාරියේ කාර්ය සාධනය පිළිබඳ විග්‍රහයක් කල නොහැකි විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ප්‍රධාන කාර්යාලය සඳහා කුලියට ගෙන තිබුණු ගොඩනැගිල්ලෙහි නව ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීම් ගොඩනැගිලි අයිතිකරු මගින් ඉටුකර නොගෙන ඒ වෙනුවෙන් අධිකාරිය රු.28,214,123 ක් වැයකර තිබුණි. ඉන් රු.මිලියන 3.5 ක් කුලී ගොඩනැගිල්ලේ වාහන ගාල් කිරීමේ භූමියේ නගර සභා අනුමැතියකින් තොරව අළුතින්ම ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් වැයකර තිබුණද එකී වියදම් අදාළ ගොඩනැගිලි සඳහා කුලියෙන් හිලව් කර ගැනීම පිළිබඳව හෝ සලකා බලා නොතිබුණි.

(ආ) එකතු කළ අගය මත බදු නිවැරදිව ගණනය නොකිරීම නිසා ඉකුත් වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක සිට වැඩිපුර ගෙවා තිබූ රු.32,688,455ක බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ව්‍යවස්ථාපිත නීති රීති උල්ලංඝණය කිරීම් අවස්ථා ගණනාවක දී අනාවරණය වීමෙන්, ඒවා පසුගිය විගණන වාර්තා මගින් පෙන්වා දුන් අතර රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින්ද මේ සම්බන්ධයෙන් දැඩි අවධානයට යොමුකර තිබුණි. මෙම දුර්වලතාවය මහහැරවීම සඳහා කළමනාකරණයේ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොමැති බව පෙනී යයි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා හමුවීම් පත්‍ර (Visiting Card) මුද්‍රණය කිරීම හා අධිකාරියේ නිලධාරීන්ගේ පවුලේ අවමංගල්‍යයන් සඳහා මල් රීඩ් වෙනුවෙන් එකතුව රු.94,652 ක් අධිකාරියේ අරමුදලින් වැයකර තිබුණි.

(ආ) සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගගණ යාත්‍රා) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගුවන් සංතරණ) යන තනතුරු වලට බඳවා ගැනීමේ පරිපාටිය (Scheme of Recruitment) අනුව ගුවන් ගමන් පාලන බලපත්‍රය (Air Traffic Controller License) අනිවාර්යෙන්ම තිබිය යුතු වුවත් එම සුදුසුකම මත බඳවාගත් නිලධාරීන් සිව්දෙනෙකුට මාසයකට රු.25,000 බැගින් සමාලෝචිත වර්ෂය තුළ රු.1,200,000 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද වෘත්තීය දීමනාව ගෙවීම් කරන කරන එම නිලධාරීන් ගුවන් ගමන් පාලන බලපත්‍රය (Air Traffic controller License) වසර ගණනාවක් තුළ අළුත් කිරීමක් ද කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් 5 දෙනෙකු ඇතුළුව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 08 දෙදෙනෙකු හා ඔවුන්ගේ පවුල්වල සියළුම සාමාජිකයින් සඳහා රෝහල් හා ශල්‍යකර්ම සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් රු.525,200 ක් අධිකාරිය වැය කර තිබුණි.

(ඇ) අමාත්‍ය කාර්ය මණ්ඩලයට බඳවාගත් නිලධාරියෙකු එහි සක්‍රීය සේවයේ සිටිය දී එම නිලධාරියාටම අධිකාරියේ නිත්‍ය කාර්ය සඳහා වූ පත්වීමක් ලබා දී තිබූ අතර එකම දිනයක් වත් අධිකාරියේ සේවයට වාර්තා කර නොතිබිය දී වැටුප්, ඉන්ධන හා වෛද්‍ය රක්ෂණ හා විදේශ ගමන් වෙනුවෙන් ඉකුත් හා සමාලෝචිත වර්ෂ වෙනුවෙන් රු.3,051,897 ක් වැය කර තිබුණි.

(ඉ) ගුවන් සේවා නියාමන කටයුතු සඳහා පමණක් පිහිටුවා ඇති අධිකාරිය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.80,000 ක මාසික වැටුපකට කොන්ත්‍රාත් පදනම මත අලෙවි ප්‍රවර්ධන උපදේශකවරයෙකු බඳවාගෙන තිබුණි. මෙම නිලධාරියා එකම දිනයක් හෝ සේවයට පැමිණ නොතිබිය දී වැටුප්, විදේශ ගමන් හා අනිකුත් වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.1,328,294 ක් ගෙවා තිබුණි.

(ඊ) 2011 වර්ෂයේ දී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවාවට වසර සියයක් සපිරීම නිමිත්තෙන් පවත්වනු ලබන උත්සවය එම වර්ෂයේ දී නොපවත්වා එය රේඛීය අමාත්‍යාංශයේ සහ අනෙකුත් සමාගම් ආයතනවල සහයෝගයකින් තොරව 2012 වර්ෂයේ දී පැවැත්වීම වෙනුවෙන් රු.14,000,000ක් වැයකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී ද රු.1,320,000ක් වැයකර තිබීම මතභේදාත්මක විය.

(උ) අධිකාරියේ මූල්‍ය රෙගුලාසි පරිපාටිය සැකසීම සඳහා බාහිර පුද්ගලයෙකුගේ සහය ලබාගෙන ඒ සඳහා රු.330,000 ක් ගෙවීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා ගෙවීම් කර තිබූ රු.66,000 ක මූලික මුදල පමණක් ගිණුම් ගතකර තිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) අධිකාරිය සඳහා කුලී පදනමට ගත් ගොඩනැගිල්ලෙහි කුලී ගිවිසුමෙහි වාර්ෂිකව වැඩිවන වරිපනම් ගාස්තු අධිකාරිය විසින් දැරිය යුතු බවට අවාසිදායක කොන්දේසියක් ඇතුලත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.285,390 ක අතිරේක වරිපනම් බද්දක් අධිකාරියේ අරමුදලින් දරා තිබුණි.

(ආ) සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නිර්මාණශීලීත්වය සහ නිර්මාණශීලීව සිතීම යන සංකල්පය යටතේ සමාලෝචිත වර්ෂයේ එළිමහන් වැඩමුළුවක් පොළොන්නරුව ගිරිතලේ ප්‍රදේශයේ සුඛෝපභෝගී හෝටලයක පවත්වා තිබූ අතර මේ සඳහා නවාතැන් ගාස්තු, කෑම බීම වියදම් හා ප්‍රවාහන වියදම් ලෙස රු. 1,801,542ක් දරා තිබුණි. ඉහත වැඩමුළුව පැය 6ක් වැනි සුළු කාලයක් තුල පවත්වා තිබූ අතර කොළඹ නගරයෙන් බැහැර ප්‍රදේශයක පවත්වා තිබුණි. තවද 2007 පෙබරවාරි 28 දිනැති අංක සී.එස්.ඒ.පී1/40 දරන ජනාධිපතිතුමා විසින් නිකුත් කළ චක්‍රලේඛයට පටහැනිව කටයුතු කර තිබුණි.

**4.5 හඳුනාගත් පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ දී මිලදී ගන්නා ලද රු.145,000 වටිනා මල්ටි මීඩියා ප්‍රොජෙක්ටරයක් අස්ථානගත වී සමාලෝචිත වර්ෂයට වසරක් ගතවී තිබූ අතර එයින් වූ අලාභය වගකිව යුතු නිලධාරියාගෙන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම විධිමත් අවසරයකින් තොරව අධිකාරි පරිශ්‍රයෙන් අදාල උපකරණය රැගෙන යාම පිළිබඳව නිලධාරියාට විරුද්ධව වෙනත් විනය ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි.

(ආ) 2009 / 2010 වර්ෂ වලදී ආදායම් බදු ලෙස රු.6,110,895 වැඩිපුර ගෙවා තිබුණි.

**4.6 නිශ්කාර්ය වියදම්**

තායිලන්තයේ බැංකොක් නුවර පැවති ආසියානු සහ පැසිපික් කලාපීය 50 වෙනි සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සමුළුව සඳහා සහභාගි වූ නිලධාරීන් 09 දෙනෙකු වෙනුවෙන් රු.2,840,572 ක් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් වැයකර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රටට හෝ සිවිල් ගුවන් සේවා අධිකාරියට ප්‍රතිලාභයක් ලබා දිය නොහැකි සේවාවේ තාක්ෂණික කටයුතු පිළිබඳ දැනුමක් හෝ ඒ පිළිබඳ වෘත්තිමය වශයෙන් සුදුසුකම් නොමැති නිලධාරීන් තුන් දෙනෙකුගේ සංචාරය වෙනුවෙන් රු.839,212 ක් අධිකාරිය විසින් දරා තිබුණි.

(ආ) සහභාගි වූ නිලධාරීන් තුන්දෙනෙකු පරිවාස කාලයේ සිටි නිලධාරිනියක් ද ඇතුළත්ව මේ වන විට සිවිල් ගුවන් සේවා අධිකාරියේ සේවයෙන් ඉවත් වී ඇති අතර ඔවුන් වෙනුවෙන් යැපීම් දීමනා, ගුවන් ටිකට්පත් හා අනියම් දීමනා සඳහා රු.874,644 ක් අධිකාරිය මගින් නිෂ්ඵල වියදමක් දරා තිබුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදුන් අධිකාරියේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පිරිඩි/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3.8.9 ඡේදයට පටහැනිව අමාත්‍යාංශයේ විවිධ වියදම් වෙනුවෙන් රු.1,774,879ක් අධිකාරිය විසින් දරා තිබුණු අතර අධිකාරිය සතු වාහන 05ක් හා නිලධාරීන් 7 දෙනෙකු අමාත්‍යාංශයට නිදහස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී එම වාහන වෙනුවෙන් ඉන්ධන හා අලුත්වැඩියා වියදම් පිළිවෙලින් රු.1,643,751ක් හා රු.3,125,074 ක් ද නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් රු.2,828,670 ක් ද අධිකාරිය විසින් දරා තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය 166 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ පුරප්පාඩු 20 ක් පැවතුණි. ඒ අතරින් පුරප්පාඩු 19 ක් විධායක ශ්‍රේණියට අදාළ විය.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂයේ දී ඇස්මේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 180 සිට සියයට 92.64 දක්වා වූ පරාසයක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ ) ආදායම් රැස්කිරීම
(ඇ) ගුවන් යානා සිද්ධි පරීක්ෂා කිරීම
(ඈ) අයවැය පාලනය
(ඉ) වියදම් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය
(උ) සේවක ණය